දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி )
e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCD/Inj/05/11/2023
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 18/05/2023
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක: 01 - 18 /2023

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල්, පළාත් මහ රෝහල් , දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන් සහ
ආයතන ප්‍රධානීන්.

**ජාතික විෂ නිවාරණ සතිය - 2023 සැප්තැම්බර් 11 – 17 දක්වා**
**"අනපේක්ෂිතව සිදුවන විෂ වීම් වළකමු."**

ජාතික විෂ නිවාරණ සතිය, ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනතුරු වැළැක්වීමේ ජාතික කේන්ද්‍රීය ඒකකය වන බෝ නොවන රෝග ඒකකය හා ඒකාබද්ධව පසුගිය වසර කිහිපය මුළුල්ලේ වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලකි. අනතුරු වැළැක්වීමේ ජාතික කමිටුව මඟින් 2007 වර්ෂයේ ගත් තීරණයක් අනුව මෙම වැඩසටහන ආරම්භ විය.

ජාතික සෞඛ්‍ය සංඛ්‍යා ලේඛනවලට අනුව, 2010 සිට 2020 දක්වා විවිධ විෂ ශරීරගත වීම් හේතුවෙන් නේවාසික ප්‍රතිකාර සඳහා රජයේ රෝහල්වලට ඇතුළත් වූ රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 1,179,184 කි. මොවුන් අතුරින් ඖෂධීය විෂවීම් නිසා රෝහල් ගත වූ සංඛ්‍යාව 21.7% (255,971) ද, පළිබෝධනාශක විෂවීම් නිසා රෝහල් ගත වූ සංඛ්‍යාව 16% (188,305) ද, සර්ප දෂ්ටන නිසා රෝහල් ගත වූවන්ගේ සංඛ්‍යාව 30.5% (359,592) ක් වන අතර ඖෂධීය නොවන අනෙකුත් ද්‍රව්‍ය විෂ වීම් නිසා රෝහල් ගතවූවන් ගණන 31.8% (375,316) කි. ඒ අනුව විෂවීම් හේතුකොට ගෙන සිදුවන රෝහල් ගතවීම් හා මරණ අවම කර ගැනීම උදෙසා 2023 වර්ෂය තුළ ජනතාව දැනුවත් කිරීම, සෞඛ්‍ය සේවා ආයතන පද්ධතින් හරහා සිදු කිරීම මෙකී චක්‍රලේඛය නිකුත් කිරීමේ අභිප්‍රාය වෙයි.

2023 වර්ෂයේදී විෂ නිවාරණ සතියේ තේමාව,

"අනපේක්ෂිතව සිදුවන විෂ වීම් වළකමු."
නියමිත කාල වකවානුව - 2023 සැප්තැම්බර් 11-17

අරමුණු-

1. විෂවීම් හේතුවෙන් රෝහල් ගත වන සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව අවම කර ගැනීම.
2. විෂවීම් අවම කර ගැනීමේ ක්‍රම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

යෝජිත කාර්යයන් -

කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට ක්‍රියාකාරි වැඩපිළිවෙලක් ආයතනය තුල සංවිධානය කිරීම.

01. දේශන සහ ප්‍රදර්ශන පැවැත්වීම
02. අත්පත්‍රිකා හා පෝස්ටර් බෙදා හැරීම

මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්ථාපිත ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් උපදෙස් හා මාර්ගෝපදේශන ලබා ගත හැකි අතර වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 011-2686143, 011-691111- දිගු අංක 2430 ඔස්සේ එම මධ්‍යස්ථානය හා සම්බන්ධ විය හැක.

මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටම දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටින අතර එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමි.මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෑම ආයතනයක් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ඔබ සේවා ස්ථානයේ සහ ප්‍රජාව තුල ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව 2023 නොවැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ / බෝනොවන රෝග ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.